# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අධිකරණයට අපහාස කිරීමේ

**අධිකරණයට අපහාස කිරීමට අදාළව දඬුවම් කිරීමේදී ඇතැම් අධිකරණවල බලතල නිර්වචනය කිරීම හා ඒ සම්බන්ධයෙන් එම අධිකරණවල ක්‍රියාපටිපාටි නියාමනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින්
2021 ජූලි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 ජූලි මස 12 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[59 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

**මිල : රු. 23.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## අධිකරණයට අපහාස කිරීමේ

**අධිකරණයට අපහාස කිරීමට අදාළව දඬුවම් කිරීමේදී ඇතැම් අධිකරණවල බලතල නිර්වචනය කිරීම හා ඒ සම්බන්ධයෙන් එම අධිකරණවල ක්‍රියා පටිපාටි නියාමනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ බලපැවැත්වීම

**1.** මේ පනත 2021 අංක       දරන අධිකරණයට අපහාස කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

නිර්වචන

**2.** මෙම පනතට අදාළව, යම් සන්දර්භයක් මගින් වෙනස් අර්ථයක් අවශ්‍ය නොවන්නේ නම්–

(අ) "අධිකරණයට අපහාස කිරීම" යනු සිවිල් අපහාස හෝ අපරාධ අපහාස වේ;

(ආ) "සිවිල් අපහාස" යනු යම් විනිශ්චයකට, තීන්දු ප්‍රකාශයකට, නියමයකට, නියෝගයකට හෝ රිට් ආඥාවක් හෝ වෙනත් අධිකරණ ක්‍රියාවලියකට චේතනාන්විතව අකීකරු වීම හෝ අධිකරණයකට ලබා දෙන ලද පොරොන්දුවක් චේතනාන්විතව කඩ කිරීම ය;

(ඇ) "සාපරාධී අපහාසය" යනු පහත දැක්වෙන යම් ක්‍රියාවක් සිදුවන ආකාරයේ යම් කරුණක් ප්‍රකාශයට පත් කිරීම (කථික හෝ ලිඛිත වචනවලින්, සංඥා මගින් හෝ දෘෂ්‍ය නිරූපනයක් මගින් හෝ වෙනත් ආකාරයකින්) හෝ යම් ක්‍රියාවක් සිදු කිරීමයි:—

(i) අපකීර්තියට පත් කිරීම හෝ අපකීර්තියට පත් කිරීමට තුඩු දෙන හෝ ඕනෑම අධිකරණයක අධිකාරය අඩු කිරීම හෝ අධිකාරය අඩු කිරීමට තුඩු දෙන; හෝ

(ii) යම් අධිකරණයක නිසි ක්‍රියා පටිපාටි අගතියට පත් කිරීම, ඊට බාධා කිරීම හෝ බාධා කිරීමට තුඩු දීම; හෝ

(iii) යුක්තිය පසිඳලීමට වෙනත් අයුරකින් බලපානු ලබන පරිදි බාධා කිරීම, බාධා කිරීමට තුඩු දීම හෝ එය වැළැක්වීම හෝ වළක්වාලීමට තුඩු දීම.

නොදැනුවත් ප්‍රකාශන කිරීම හෝ බෙදා හැරීම අපහාසයක් නොවන බව

**3.** (1) යම් පුද්ගලයකු විසින් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකට අදාළව යුක්තියේ ගමන්මගට බාධා කරන, බාධා කිරීමට තුඩු දෙන හෝ එම ගමන්මග වළක්වන හෝ එසේ කිරීමට තුඩුදෙන අන්දමින් (කථික හෝ ලිඛිත වචනවලින්, සංඥා මගින් හෝ දෘෂ්‍ය නිරූපනයන් මගින් හෝ වෙනත් ආකාරයකින්) යම් ප්‍රකාශනයක් සිදු කරන අවස්ථාවේදී, එම කරුණට අදාළව යම් නඩු කටයුත්තක් පවතින බව පිළිබඳව විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු නොතිබුනි නම්, එවන් අවස්ථාවක දී ඔහු අධිරණයට අපහාස කිරීමේ වරදක් සිදු නොකරයි.

(2) මෙම පනතෙහි හෝ සමකාලීනව බලපවත්නා වෙනත් නීතියක මීට පටහැනිව කුමක් සඳහන් වුවද ඉහත (1) උපවගන්තියෙහි සඳහන් අන්දමෙන් අදාළ ප්‍රකාශය සිදු කරනු ලබන අවස්ථාව වන විට නොපවතින සිවිල් හෝ අපරාධ නඩු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අධිකරණයට අපහාස කිරීමේ වරදක් ස්ථාපනය වන්නේ යැයි නොසැලකිය යුතු ය.

(3) ඉහත (1) උපවගන්තිය යටතට ගැනෙන යම් ප්‍රකාශනයක් බෙදාහැරීම සිදු කරනු ලබන අවස්ථාව වන විට එම ප්‍රකාශනය තුළ උක්ත වර්ගයට ගැනෙන යම් අන්තර්ගතයක් අඩංගු වේ යැයි විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු නොමැති විට, ඔහු විසින් අධිකරණයට අපහාසයක් සිදු කරනු ලැබීමේ වරදක් සිදු කළේ යැයි නොසැලකිය යුතු ය.

පහත ආකාරයේ ප්‍රකාශන බෙදාහැරීමට අදාළව මෙම නීතිය අදාළ නොවන බව සැලකිය යුතු වේ:—

(i) පවතින නීතියට අනුකූලව මුද්‍රණය හෝ ප්‍රකාශනය නොකළ පුවත්පතක් හෝ ග්‍රන්ථයක් වන ඕනෑම ප්‍රකාශනයක්;

(ii) පවතින නීතියට අනුකූලව ප්‍රකාශනය නොකළ පුවත්පතක් වන ඕනෑම ප්‍රකාශනයක්.

*පැහැදිලි කිරීම* - මෙම වගන්තියෙහි අරමුණ පිණිස යම් නඩු ක්‍රියාමාර්ගයක්,

(අ) පවතින බව සැලකිය යුතු අවස්ථා-

(1) සිවිල් නඩු ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන්, පැමිණිල්ලක් ගොනු කිරීම හෝ වෙනත් ක්‍රමයක් මගින් නඩු කටයුත්තක් ආරම්භ කිරීම මගින්,

(2) අපරාධ විධිවිධාන සංග්‍රහය හෝ අන් කවර හෝ නීතියක් යටතේ අපරාධ නඩු ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් ;

(i) යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි චූදිතයාට එරෙහිව චෝදනා පත්‍රය ගොනු කොට ඇති විට හෝ අධිකරණය විසින් සිතාසි හෝ වරෙන්තු නිකුත් කරන විට දී; සහ

(ii) වෙනත් ඕනෑම අවස්ථාවක දී, නඩු කටයුත්තකට අදාළ වන කරුණ අධිකරණයේ සැලකිල්ලට ලක් වන විට දී; සහ

සිවිල් සහ අපරාධ නඩු ක්‍රියා මාර්ගයක් සම්බන්ධයෙන් එම නඩුව විනිශ්චය කොට තීන්දු නිකුත් කරන තෙක් එම නඩු විමසීම පවතින බව සැලකිය යුතු වේ. එනම්, අභියාචනයක් හෝ සංශෝධනයක් වලංගු වේ නම් එකී අභියාචනය හෝ සංශෝධනය අධිකරණ විමර්ශනයට භාජනය කොට අවසාන වශයෙන් තීන්දු කරන තෙක්, හෝ අභියාචනයක් හෝ සංශෝධනයක් අපේක්ෂා නොකරයි නම්, අභියාචනයක් හෝ සංශෝධනයක් සඳහා අයදුම් කළ හැකි කාල පරිච්ඡේදය ගෙවී යන තෙක් නඩු ක්‍රියාවලිය පවතින බව සැලකිය යුතු වේ;

(ආ) යම් නඩු ක්‍රියාවලියක් අධිකරණය විසින් විමසීමට භාජනය කොට අවසන් වශයෙන් තීරණය කරන ලදුව ඇති නම්, එම තීන්දුව ප්‍රකාර විධානය /ආඥාව හෝ දඬුවම ක්‍රියාවට නැගී නොමැති වීම අදාළ නඩුව තවමත් බලපැවැත්වෙන බව සැලකීමට කරුණක් වන්නේ නැත.

*අධිකරණ ක්‍රියාවලි සාධාරණ හා නිවැරදි ලෙස වාර්තා කිරීම අධිකරණයට අපහාස කිරීමක් නොවන බව*

**4.** 7 වන වගන්තියේ අඩංගු විධිවිධානවලට යටත්ව, අධිකරණ ක්‍රියාමාර්ගයක් හෝ එහි ඕනෑම අදියරක් පිළිබඳ සාධාරණ හා නිවැරදි වාර්තාවක් ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙන් පුද්ගලයකු අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු නොවිය යුතු ය.

*අධිකරණ ක්‍රියාවක් සාධාරණ ලෙස විවේචනය කිරීම අධිකරණයට අපහාස කිරීමක් නොවන බව*

**5.** විභාග කර අවසානයේ තීරණය කරන ලද කවර හෝ නඩුවක හරය පිළිබඳව සාධාරණ අදහස් දැක්වීමක් කිරීම හේතුවෙන් පුද්ගලයකු අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු නොවිය යුතු ය.

*පහළ අධිකරණවල මුලසුන දරන නිලධාරීන්ට එරෙහිව පැමිණිලි කිරීම අපහාසයක් නොවන බව*

**6.** යම් පහළ අධිකරණයක මුලසුන දරන නිලධාරීන්ට එරෙහි යම් පුද්ගලයකු විසින් යහපත් චේතනාවෙන් යුතුව ප්‍රකාශයක් පළකිරීම හේතුවෙන් පුද්ගලයකු අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු නොවිය යුතු ය.

*පැහැදිලි කිරීම* - මෙම වගන්තියෙහි "පහළ උසාවි" යනුවෙන් අදහස් කරනුයේ, අධිකරණ සේවා කොමිසම යටතේ ඇති වෙනත් ඕනෑම අධිකරණයකි.

*ඇතැම් අවස්ථාවලදී හැර, අධිකරණ මැදිරිවල හෝ රහසිගත ලෙස සිදු කෙරෙන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු වාර්තා කිරීම අධිකරණයට අපහාස කිරීමක් නොවන බව*

**7.** (1) මෙම පනතේ අඩංගු කිසිවකට පටහැනි වුව ද, පහත දැක්වෙන නඩු හැරුණු විට, ඕනෑම අධිකරණයක මැදිරියක හෝ රහස්‍ය ලෙස සිදු කරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගයක් පිළිබඳ සාධාරණ හා නිවැරදි වාර්තාවක් පළකිරීම සම්බන්ධයෙන් පුද්ගලයකු අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු නොවිය යුතු ය. එනම්-

(අ) ප්‍රකාශණය සමකාලීනව බලපවත්වන ඕනෑම පනතක ප්‍රතිපාදනවලට එරෙහි වන අවස්ථාවක දී;

(ආ) අධිකරණය විසින්, රාජ්‍ය ප්‍රතිපත්තියේ පදනම මත හෝ ඒ වෙත පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී, අධිකරණ ක්‍රියාවලියට අදාළ සියලු තොරතුරු ප්‍රකාශයට පත්කිරීම හෝ ප්‍රකාශයට පත් කරනු ලබන යම් විස්තරයකට අදාළ තොරතුරු ප්‍රසිද්ධ කිරීම නිශ්චිත වශයෙන්ම තහනම් කර ඇති අවස්ථාවක දී;

(ඇ) මහජන සාමය හෝ රජයේ ආරක්ෂාව සම්බන්ධ හේතූන් මත ඕනෑම අධිකරණයක මැදිරියක් තුළ හෝ රහස්‍ය ලෙස සිදු කරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගයක්, එම කටයුතුවලට අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම;

(ඈ) නඩු කටයුතුවල කරුණක් වන තොරතුරු රහසිගත ක්‍රියාවලික්, සොයාගැනීමක් හෝ නව නිපැයුමක් හා සම්බන්ධ වන අවස්ථාවක දී.

(2) ඉහත (1) වන උපවගන්තියේ අඩංගු විධිවිධානවලට අගතියකින් තොරව, රාජ්‍ය ප්‍රතිපත්තියේ පදනම මත හෝ මහජන සාමය හෝ රාජ්‍යයේ ආරක්ෂාව හා සම්බන්ධ හේතු නිසා හෝ රහසිගත ක්‍රියාවලියක්, සොයාගැනීමක් හෝ නව නිපැයුමක් හෝ එහි ඇති ඕනෑම බලයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තොරතුරු එහි අඩංගුය යන පදනම මත අධිකරණය විසින් ප්‍රකාශිතව යම් තොරතුරක් ප්‍රසිද්ධියට පත්කිරීම නිශ්චිත වශයෙන් ම තහනම් කර ඇත්නම් මිස, ඕනෑම අධිකරණයක මැදිරියක හෝ රහස්‍ය ලෙස සිදු කරනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගයක් අනුව නිකුත් කරන ලද නියෝගයක පාඨය සමස්ථයක් හෝ යම් කොටසක් ලෙස ප්‍රකාශයට පත් කිරීම හෝ එහි සාධාරණ හා නිවැරදි සාරාංශයක් ප්‍රකාශයට පත්කිරීම අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් පුද්ගලයකු වරදකරුවකු නොවිය යුතු ය.

වෙනත් විත්තිවාචකයන්ට බලපෑමක් නොමැති බව

**8.** මෙම පනතේ සඳහන් කිසිවක්, උසාවියට අපහාස කිරීමට එරෙහිව වන ඕනෑම කටයුත්තක දී වලංගු විය හැකි විත්තිවාචකයක් ලබා ගැනීමට ඇති හැකියාව මෙම පනතේ විධිවිධාන හේතු කොට ගෙන අහෝසි වී ඇති බව අඟවන ලෙස අවබෝධ කොට ගත යුතු නොවේ.

අධිකරණයට අපහාස කිරීමේ විෂය පථය විශාල කිරීම ඇඟවීම සඳහා වන පනතක් නොවන බව

**9.** මෙම පනතේ සඳහන් කිසිවක් මගින් අධිකරණයට අකීකරු වීම, නියෝග කඩ කිරීම හෝ අපහාසාත්මක ප්‍රකාශන නිකුත් කිරීම හෝ වෙනත් ක්‍රියාවක් සඳහා නීති ප්‍රකාරව දඬුවම් පැමිණවීමට මෙම පනතෙන් හැර වෙනත් පනතකින් නොහැකි බව අඟවන ලෙස අවබෝධ කොට ගත යුතු නොවේ.

පහල අධිකරණවල අපහාසයන්ටද දඬුවම් කිරීමට අභියාචනාධිකරණය සතු බලය

**10.** උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් එයට යටත් වන අධිකරණවලට සිදු කෙරෙන අපහාස සම්බන්ධයෙන් ක්‍රියා කිරීම පිණිස අභියාචනාධිකරණයට තම ක්‍රියා පටිපාටිය හා භාවිතයට අනුකූලව එකම අධිකරණ බලය, බලතල සහ අධිකාරය තිබිය යුතු ය.

තම අධිකරණ බල සීමාවෙන් පිටතට ගැනෙන වැරදිවලට එරෙහිව හෝ වැරදිකරුවන්ට එරෙහිව නඩු විභාග කිරීමට අභියාචනාධිකරණය සතු බලය

**11.** තම අධිකරණයට හෝ තමා යටතේ පවතින වෙනත් අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධ නඩු කටයුතුවලදී, එකී අපහාසය තම පරිස්ථානීය බලය සහිත අධිකරණ බල සීමාව තුල හෝ ඉන් පිටත සිදු වී තිබුණ ද එසේ අධිකරණයට අපහාස කිරීමේ චෝදනාවට ලක් වන්නකු එකී අධිකරණ බල ප්‍රදේශ සීමා තුලට හෝ ඉන් පිටතට අයත් වුව ද නඩු ඇසීමේ සහ දඬුවම් කිරීමේ අධිකාරිය අභියාචනාධිකරණයට හිමි වේ.

අධිකරණයට අපහාස කිරීමට අදළ දඬුවම්

**12.** (1) මෙම පනතෙහි හෝ වෙනත් නීතියක ප්‍රකාශිතව සඳහන් වන වෙනත් යමක් නොවේ නම්, අධිකරණයට අපහාස කිරීමේ වරදට මාස හයක් දක්වා දීර්ඝ කළ හැකි සරළ බන්ධනාගාරගත කිරීමක් හෝ රුපියල් 10,000 ක උපරිමයට යටත් දඩයක් හෝ මෙකී දණ්ඩණ දෙකම පැනවීම සිදු කළ හැකිය:

මෙම දණ්ඩන පැනවීම, අධිරකරණය සෑහීමකට පත් වන පරිදි චූදිතයා විසින් අධිකරණයෙන් සමාව අයදීම මත වරදෙන් මුදවා හැරීමට හෝ නියම කරන ලද දඬුවම ඉවත් කිරීමට ඇති හැකියාවට යටත් වේ.

*පැහැදිලි කිරීම* - චූදිතයා අධිකරණයෙන් සමාව අයැදීමෙන් යහපත් චේතනාවෙන් කටයුතු කරන්නේ නම් එම සමාව අයැදීම සුදුසුකම්ලත් හෝ කොන්දේසි සහිත යැයි යන පදනම මත සමාව ඉල්ලීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(2) සමකාලීනව බලපවත්වන කවර හෝ නීතියක කුමක් සඳහන් වුවද, දඬුවම් නියම කරන අධිකරණයකට හෝ ඊට යටත් අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධයෙන් කිසිදු අධිකරණයක් විසින් (1) වන උපවගන්තියේ දක්වා ඇති ප්‍රමාණයට වඩා වැඩි දඬුවමක් නියම නොකළ යුතු ය.

(3) මෙම වගන්තියෙහි කුමක් සඳහන් වුවද, සිවිල් අධිකරණ අපහාසයකට වැරදිකරු වන පුද්ගලයකු සම්බන්ධයෙන්, හුදෙක් දඩයක් නියම කිරීම මගින් යුක්තිය ඉටු නොවන බව සහ සිරගත

කිරීමේ දණ්ඩනයක් අවශ්‍ය බව අධිකරණයට ඒත්තු යන්නේ නම්, සරල සිරගත කිරීමක් වෙනුවට, අධිකරණය අවශ්‍ය යැයි සිතෙන පරිදි, එම පුද්ගලයා මාස 6කට නොවැඩි කාලයක් සඳහා සිවිල් සිරගත කිරීමකට යටත් කිරීමට අධිකරණයට හැකි ය.

(4) අධිකරණයකට ලබා දී ඇති කවර හෝ පොරොන්දුවකට අදාළව අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වූ පුද්ගලයා සමාගමක් වන විටක දී, අදාළ අපහාසය සිදු කරන ලද අවස්ථාවේ දී, අදාළ සමාගමේ ව්‍යාපාර කටයුතු මෙහෙයවීම සම්බන්ධයෙන් වගකිව යුතු වූ සහ ලැබිය යුතු බලය හිමිව සිටි සෑම පුද්ගලයකුම මෙන්ම අදාළ සමාගම ද අධිකරණයට අපහාස කිරීමේ වරදට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු අතර, අධිකරණයේ අවසරයට යටත් ව, එවැනි එක් එක් පුද්ගලයා සිවිල් බන්ධනාගාර තුළ රඳවා තබා ගැනීමෙන් දඬුවම ක්‍රියාත්මක කළ හැකි ය.

මෙම උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, යම් චූදිතයකු විසින් අදාළ අධිකරණ අපහාසය සිදු වූයේ තම අනුදැනුමෙන් තොරව බව ඔප්පු කළහොත් හෝ එකී අධිකරණ අපහාසය වැළැක්වීම සඳහා ඔහු නිසා උත්සාහය දැරූ බව ඔප්පු වුවහොත්, එකී පුද්ලගලයා මෙම උපවගන්තියේ අඩංගු පරිදි වරදක් සිදු කළ බවට වගකිව යුතු නොවේ.

(5) ඉහත (4) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, එහි සඳහන් පරිදි යම් සමාගමක් විසින් අධිකරණයට අපහාස කිරීම සිදු කර ඇති විටක, එකී අපහාස කිරීම සිදු කෙරී ඇත්තේ එකී සමාගමේ යම් අධ්‍යක්ෂ, කළමනාකරු, ලේකම් හෝ වෙනත් නිලධාරියකුගේ කැමැත්තෙන් හෝ එකඟතාවයකින් යුතුව බව ඔප්පු වී ඇති නම්, එම අධ්‍යක්ෂ, කළමනාකරු, ලේකම් හෝ වෙනත් නිලධාරියකු අපහාසයට, වරදකරුවකු ලෙස සලකනු ලබන අතර, අධිකරණයේ අභිමතය පරිදි, එවැනි අධ්‍යක්ෂ, කළමනාකරු, ලේකම් හෝ වෙනත් නිලධාරියකු සිවිල් සිරගත කිරීමේ දඬුවම් බලාත්මක කිරීමට යටත් කළ හැකි ය.

*පැහැදිලි කිරීම* - මෙහි (4) සහ (5) උපවගන්තිවල අර්ථය පිණිස-

(අ) ''සමාගම'' යනු, නෛතික පුද්ගලභාවය හිමි සංස්ථාගත මණ්ඩලයක් වන අතර, ඊට ආයතනයක් හෝ වෙනත් පුද්ගල සාංගමිකයක් ඇතුළත් වේ; සහ

(ආ) ''අධ්‍යක්ෂවරයා'' යනු, සමාගමක් සම්බන්ධයෙන් නම් එහි පාර්ශ්වකරුවෙකි.

ඇතැම් අවස්ථාවලදී අධිකරණයට අපහාස කිරීමට දඬුවම් නොකිරීම

**13.** සමකාලීනව බලපවත්නා කුමන හෝ නීතියක කුමක් සඳහන් වුව ද-

(අ) යම් අධිකරණයට අපහාස කිරීමක් සැලකිය යුතු ලෙස නිසි යුක්තිය පසඳලීමේ කාර්යයට අවහිර කිරීමක් හෝ බාධා කිරීමක් වන ආකාරයේ ස්වභාවයක් ඇති බවට අධිකරණය සෑහීමකට පත් වන්නේ නම් පමණක් මිස කිසිදු අධිකරණයක් විසින් එවන් අපහාසයක් සඳහා දඬුවමක් නියම නොකළ යුතු ය;

(ආ) උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් සිදු කෙරෙන ඕනෑම නඩු කටයුත්තක දී, යම් අපහාසාත්මක කාර්යයකට තුඩු දෙන ලැබුවේ සත්‍යයක් නම්, එය වලංගු විත්තිවාචක ආරක්ෂාවක් ලෙස යුක්ති සහගත යැයි පිළිගැනීමට අධිකරණය විසින් අවසර දිය හැකි අතර, අධිකරණය එසේ කළ යුතු වන්නේ, එම අපහාසාත්මක කාර්යය මහජන යහපතට හේතු වී ඇති බවට සෑහීමකට පත් වේ නම් සහ විත්තිය විසින් උක්ත ඉල්ලීම අවංකව ඉදිරිපත් කරන බවට සෑහීමකට පත් වන්නේ නම් පමණි.

අභියාචනාධිකරණය ඉදිරියේ උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිය

**14.** (1) යම් පුද්ගලයකු අධිකරණයට අපහාස කළ බවට චෝදනා ලද විට හෝ එසේ කළේ යැයි අභියාචනාධිකරණයට, තමා ඉදිරියේ හෝ නඩු විභාගයේ දී වැරදිකරුවකු වී ඇති බවට සිය මතය අනුව පෙනී යන විට, එම පුද්ගලයා අත්අඩංගුවේ රඳවා තබා ගැනීමට කටයුතු කිරීමට අධිකරණයට හැකි වන අතර, අධිකරණය සිය කටයුතු එදිනට අවසන් කිරීමට පෙර, එදිනම හෝ ඉන් ඉක්බිතිව හැකි ඉක්මනින් පහත පරිදි කටයුතු කළ යුතු වේ:—

(අ) තමාට එරෙහිව එල්ල වී ඇති අපහාස චෝදනාව පිළිබඳව ලිඛිතව එම පුද්ගලයාට දැන්වීම;

(ආ) තමාට එරෙහිව එල්ල වී ඇති අපහාස චෝදනාව සම්බන්ධයෙන් පෙනී සිටීමට ඔහුට අවස්ථාවක් ලබා දීම;

(ඇ) අවශ්‍ය පරිදි සාක්ෂි ලබා ගැනීමෙන් අනතුරුව හෝ එම පුද්ගලයා විසින් ඉදිරිපත් කරන සාක්ෂි එක්රැස් කිරීමෙන් අනතුරුව සහ එම පුද්ගලයා විසින් ඉදිරිපත් කරනු ලබන කරුණුවලට සවන් දීමෙන් පසු එම චෝදනාවේ හරය පිළිබඳව වහාම හෝ කල් තැබීමෙන් පසු තීරණය කිරීම; සහ

(ඈ) යුක්තිසහගත වන පරිදි එම පුද්ගලයා දඬුවම් නියම කිරීමට හෝ ඔහුව නිදෙස් කොට නිදහස් කිරීමට කටයුතු කිරීම.

(2) උක්ත (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, එම උපවගන්තිය යටතේ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් චෝදනාවට ලක් වූ පුද්ගලයකු විසින් ඔහුට එරෙහිව ඉදිරිපත්ව ඇති අධිකරණයට අපහාස කිරීම සිදු වූයේ තමන් ඉදිරියේ යැයි කියන විනිසුරුවරයා හෝ විනිසුරුවරුන් විසින් විමර්ශනය කිරීමට නියමිතව ඇති විටක ඔහු හෝ ඔවුන් හැර වෙනත් විනිසුරුවරයකු විසින් විභාග කරනු ලැබීම සඳහා ලිඛිත හෝ වාචික ඉල්ලීමක් ඉදිරිපත් කරයි නම්, එසේ සිදු කිරීම ප්‍රායෝගික බවත් යුක්තිය නිසි ලෙස පසිඳලීම පිණිස එසේ සිදු කිරීම පිණිස එම ඉල්ලීමට අවසර ලබා දිය යුතු බවත්, අධිකරණයට පෙනී යන්නේ නම්, එවිට අධිකරණය විසින්, එම නඩු කාරණය අදාළ නඩු විභාගය පිළිබඳ කරුණු අඩංගු වාර්තාවක් ද සහිතව අගවිනිසුරුවරයා හට සුදුසු යැයි හැඟෙන නියෝග ලබා දීම සඳහා ඔහු ඉදිරියේ තැබිය යුතු ය.

(3) වෙනත් කුමන හෝ නීතියක කුමක් සඳහන් වුව ද, උක්ත (1) වන උපවගන්තිය ප්‍රකාරව අධිකරණයට අපහාස කිරීමේ චෝදනාවට ලක් වූ පුද්ගලයකු සම්බන්ධ ඕනෑම නඩු විභාගයක් සඳහා උක්ත (2) වන උපවගන්තියට අනුව නියෝගයක් ලබා දීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිරිපත්ව ඇති අධිකරණයට අපහාස කිරීම සිදුවූයේ තමන් ඉදිරියේ යැයි කියනු ලබන විනිසුරුවරයා හෝ විනිසුරුවරුන් හැර වෙනත් විනිසුරුවරයකු ඉදිරියේ අදාළ නඩු විභාගය සිදු කෙරේ නම්, එකී අධිකරණයට අපහාස කිරීම සිදුවූයේ තමන් ඉදිරියේ යැයි කියනු ලබන විනිසුරුවරයා හෝ විනිසුරුවරුන් සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් වීම අවශ්‍ය නොවිය හැකි අතර, උක්ත (2) වන උපවගන්තියට අනුව අගවිනිසුරුවරයා වෙත ඉදිරිපත් කරන වාර්තාව නඩුවේ සාක්ෂි ලෙස සලකනු ලබනු ඇත.

(4) චෝදනාව සම්බන්ධයෙන් විනිශ්චය ලබා දෙන තෙක්, මෙම වගන්තිය යටතේ අපහාසයට ලක් වූ පුද්ගලයකු පහත නිශ්චිතව දක්වා ඇති පරිදි අත්අඩංගුවේ රඳවා තබන ලෙස අධිකරණය නියම කළ හැකි ය:

අධිකරණය විසින් සුදුසු යැයි සිතන තරම් මුදල් ප්‍රමාණයක් සඳහා ඇපකරුවන් සහිතව හෝ රහිතව ඇපකරයක් ඉදිරිපත් කෙරෙන්නේ නම්, චෝදනාවට ලක් වූ පුද්ගලයා එකී බැඳුම්කරයේ සඳහන් වේලාවට හා ස්ථානයට පැමිණිය යුතු බවටත්, අධිකරණය

විසින් වෙනත් නියෝගයක් ලබා දෙන තුරු ඔහු දිගටම එසේ පැමිණිය යුතු බවටත්, එකී චෝදනාවට ලක් වූ පුද්ගලයා කොන්දේසිගත කිරීමෙන් අනතුරුව ඔහු ඇප මත නිදහස් කළ යුතු ය:

තවදුරටත්, අධිකරණය විසින් සුදුසු යැයි අදහස් කරයි නම්, එකී පුද්ගලයාට ඇප නියම කිරීමකින් හෝ ශරීර ඇප නොමැති බැඳුම්කරයක් ප්‍රකාරව උක්ත කොන්දේසි මත පැමිණීමට සලස්වා නිදහස් කොට යැවිය හැකිය.

විනිසුරුවරයකු මහෙස්ත්‍රාත්වරයකු හෝ අධිකරණමය වශයෙන් කටයුතු කරන වෙනත් පුද්ගලයකු විසින් අධිකරණයට අපහාස කරනු ලැබීම

**15.** (1) සමකාලීනව බලපැවැත්වෙන කාලසීමාව සඳහා කවර හෝ නීතියක විධිවිධානවලට යටත්ව, විනිසුරුවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ අධිකරණමය වශයෙන් කටයුතු කරන වෙනත් පුද්ගලයකු ද තම අධිකරණයට හෝ වෙනත් අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර, මෙම පනතේ විධිවිධාන, හැකිතාක් දුරට ඒ අනුව අදාළ වේ.

(2) යටත් අධිකරණයක් සම්බන්ධයෙන්, විනිසුරුවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ අධිකරණමය වශයෙන් කටයුතු කරන වෙනත් පුද්ගලයකු විසින් තමා විසින් යටත් උසාවියක් සම්බන්ධයෙන් විභාග කරන අභියාචනයක් හෝ සංශෝධනයක් සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණ හෝ ප්‍රකාශයන්ට මෙම කොටසේ කිසිවක් අදාළ නොවේ.

අපහාසයක් හඳුනාගැනීමෙන් අනතුරුව පටිපාටිය

**16.** (1) ඉහත 14 වන වගන්තිය යටතේ කෙරෙන සෑම ක්‍රියාමාර්ගයක්ම, අධිකරණය විසින් වෙනත් ආකාරයකින් නියම කරනු ලැබ, ඒ මන්ද යැයි හේතු වාර්තා කොට තැබුවහොත් මිස, චෝදනාවට ලක් වූ තැනැත්තාට අධිකරණය විසින් පෞද්ගලිකව දැන්විය යුතු වේ.

(2) එම දැනුම්දීම සමග ඉදිරිපත් කළ යුතු ලේඛන මෙසේය:—

(අ) මෝසමක් මත යම් නඩු කටයුත්තක් ආරම්භ වූ විට, මෝසමේ පිටපතක් මෙන්ම එවැනි මෝසමකට හේතු වූ දිවුරුම් ප්‍රකාශවල පිටපත් ද තිබේ නම් ඒවා ද සහිතව; සහ

(ආ) නඩු ක්‍රියාමාර්ග ආරම්භ කෙරෙනුයේ යම් පහළ අධිකරණයක් විසින් සිදු කළ දැනුම්දීමක් අනුව නම්, එම පහළ අධිකරණය මගින් සිදු කළ දැනුම්දීමෙහි පිටපතක්.

(3) ඉහත 14 වන වගන්තිය යටතේ චෝදනාවට ලක් වූ පුද්ගලයකු දඬුවම්දීමකින් වැළකී සිටීම සඳහා ඉඩ ඇති බව හෝ මග හැර යාමට ඉඩ ඇති බවට අධිකරණය සෑහීමකට පත් වේ නම්, එම අධිකරණය සාධාරණ යැයි සිතන පරිදි එම පුද්ගලයා සතු දේපළ තහනම් කිරීමේ නියෝගයක් සිදු කිරීමට නියෝග කළ හැකිය.

(4) 3 වන උපවගන්තිය යටතේ සිදු කෙරෙන සෑම දේපළ පවරා ගැනීමක් ම සිවිල් නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති ආකාරයට මුදල් නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට කළ යුතු අතර, එසේ දේපළ පවරා ගැනීමෙන් අනතුරුව, චෝදනාවට ලක් වූ පුද්ගලයා පෙනී සිටිමින් අධිකරණය දඬුවම් දීමෙන් වැළකී සිටීම සඳහා ඔහු පළාගොස් හෝ මගහැර නොසිටි බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, එකී පවරා ගනු ලැබූ දේපළ යළි මුදා හැරීමට සුදුසු පරිදි අධිකරණය තීරණය කළ යුතු වේ.

(5) උක්ත 14 වන වගන්තිය යටතේ අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ ඕනෑම පුද්ගලයකුට ඔහුගේ විත්තියට පක්ෂව දිවුරුම් ප්‍රකාශයක් ගොනු කළ හැකි අතර, ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශ මත හෝ අවශ්‍ය විය හැකි තවත් සාක්ෂි ලබා ගැනීමෙන් පසුව අධිකරණය විසින් චෝදනාව පිළිබඳ කාරණය පිළිබඳව විනිශ්චය කළ හැකි අතර, නඩුව සම්බන්ධ යුක්තියට අවශ්‍ය වන පරිදි නියෝග කළ යුතු ය.

අභියාචනයන්

**17.** (1) අධිකරණයට අපහාස කිරීම වෙනුවෙන් දඬුවම් කිරීම සඳහා අභියාචනාධිකරණය විසින් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඊට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අයිතියක් තිබේ:—

(අ) තනි විනිසුරුවරයකුගේ නියෝගය හෝ තීන්දුව සහිත අවස්ථාවක දී අධිකරණයේ විනිසුරුවන් දෙදෙනකුට නොඅඩු විනිසුරු මඩුල්ලකට;

(ආ) විනිසුරු මඩුල්ලක නියෝගයක් හෝ තීන්දුවක් සහිත අවස්ථාවක දී ශ්‍රේෂ්ඨාධිකරණයට.

(2) ඕනෑම අභියාචනයක් විභාග වෙමින් පවතින අතරතුර, අභියාචනාධිකරණය විසින් පහත පරිදි නියෝග කළ හැකි ය:—

(අ) අභියාචනය ඉදිරිපත් කරන ලද දඬුවම හෝ නියෝගය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමට;

(ආ) අභියාචකයා සිරගතව සිටී නම් ඔහු ඇප මත නිදහස් කිරීමට; සහ

(ඇ) අභියාචකයා විසින් ඔහු අධිකරණයට අපහාස කිරීම ඉවත් කර නොමැති බව නොතකා අභියාචනය විභාග කිරීමට.

(3) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ඕනෑම නියෝගයකින් අගතියට පත් ඕනෑම අයකු අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට අභියාචනාධිකරණය සෑහීමකට පත්වන විට, මහාධිකරණයට (2) වන උපවගන්තිය මගින් පවර ඇති සියලු හෝ ඕනෑම බලයක් ක්‍රියාත්මක කළ හැකි ය.

අපහාස කිරීම සඳහා වන නීතිමය කටයුතු සඳහා සීමාව

**18.** අපහාසයක් සිදුවූ බවට චෝදනා කරනු ලබන දින සිට වසරක කාලයක් ඉකුත්වීමෙන් පසු කිසිදු අධිකරණයක් විසින් ස්වකීය යෝජනාවකින් හෝ වෙනත් ආකාරයකින් අපහාස කිරීම සම්බන්ධයෙන් නඩු ක්‍රියාදමයක් ආරම්භ නොකළ යුතු ය.

අධිකරණයට අපහාසයට අදාළ වෙනත් නීතිවලට අමතරව මිස ඒවා බලහීන නොකරන බව

**19.** මෙම පනතේ විධිවිධාන අධිකරණයට අපහාස කිරීම සම්බන්ධ වෙනත් නීතියක විධිවිධානවලට අමතරව මිස ඒවා කිසිදු අයුරකින් බලහීන නොකළ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**20.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.